# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2012 අංක 18 දරන ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2012 අගෝස්තු මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.50 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# 2012 අංක 18 දරන ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2012 අගෝස්තු මස 06 වැනි දින]

එල්.ඩී.—ඕ.(අයි.එන්.සී.) 22/2011.

## ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

“ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, ඒ පදනමේ, පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ඨ කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2012 අංක 18 දරන ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු “පදනම” යනුවෙන් සඳහන් කරනු ලබන) ආචාර්ය මාලනී ෆොන්සේකා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු “සංස්ථාව” වශයෙන් හඳුන්වනු ලබන) “ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ආචාර්ය මාලනී ෆොන්සේකා පදනම සංස්ථාගත කිරීම.

**3.** (1) සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ සෞන්දර්යාත්මක, ප්‍රාසංගික සහ සම්ප්‍රදායික කලා සහ ශිල්ප පෝෂණය කිරීම සහ ආරක්ෂා කිරීම සහ

එවැනි කලා හා ශිල්ප ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම;

(ආ) ශ්‍රී ලාංකීය කලාකරුවන්ගේ සහ ශ්‍රී ලාංකීය කලා සහ ශිල්ප ප්‍රවර්ධනය කිරීමේ නියැලී සිටින තැනැත්තන්ගේ සමාජීය, ශාස්ත්‍රීය සහ ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා සුදුසු ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ, කාන්තාවන්ගේ සහ ළමයින්ගේ සුභ සාධනය සඳහා සුදුසු ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ දිළිඳු සහ ආධාර ලැබිය යුතු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව සහ මුදල් ආධාර ප්‍රදානය කිරීම සහ විශේෂයෙන්ම උසස් අධ්‍යාපන කටයුතුවල නියැලීම සඳහා ඔවුන්ට පහසුකම් සැලසීම;

(ඉ) සිංහල ශිෂ්‍යයන්ට දෙමළ භාෂාව ඉගැන්වීම සඳහා සහ දෙමළ ශිෂ්‍යයන්ට සිංහල භාෂාව ඉගැන්වීම සඳහා උචිත වැඩ සටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඊ) ශ්‍රී ලාංකීය ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා උචිත වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(උ) ග්‍රාමීය ශිෂ්‍යයන්ගේ පරිගණක දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතිව විශේෂයෙන්ම ග්‍රාමීය හා ඌන සංවර්ධන ප්‍රදේශවල තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඌ) කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තවල නියැලී සිටින තැනැත්තන්ට නූතන තාක්ෂණික තොරතුරු සහ වෙනත් අවශ්‍ය සහාය ලබා දීමෙන් ඔවුන්ට සහාය දීම;

(එ) දිළිඳු ජනතාවගේ සුභ සාධන සහ සංවර්ධන කටයුතු සඳහා දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඒ) ළමයින්ගේ සහ තරුණයින්ගේ දක්ෂතා සහ රුචිකත්වයන් අනුව ඔවුන් අතර, ක්‍රීඩා කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඔ) ශ්‍රී ලාංකිකයන් අතර මූලික අයිතිවාසිකම්, මූලික යුතුකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහ පාලනය වැනි සංකල්ප ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව එවැනි සංකල්ප පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම; සහ

(ඕ) සංස්ථාවේ අරමුණුවලට සමාන අරමුණු ඇති දේශීය සහ විදේශීය ආයතන සමග සම්බන්ධීකරණය සහ සහයෝගයෙන් ක්‍රියා කිරීම.

(2) මේ පනතේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, කුලය, ආගම, භාෂාව, ස්ත්‍රී පුරුෂ භේදය හෝ දේශපාලන මතය යන කරුණු සම්බන්ධයෙන් කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව කටයුතු කිරීමට සංස්ථාව විසින් සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව සංස්ථාවේ අරමුණු හෝ ඉන් යම් අරමුණක් ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය හෝ උපයෝගී වන සියලු ක්‍රියා සහ කාරණා ඉටු කිරීමට, කිරීමට සහ ක්‍රියාවේ යෙදවීමට සංස්ථාවට බලය ඇත්තේ ය.:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම ඉදිකිරීම, අලුත්වැඩියා කිරීම හෝ අන්‍යාකාරයකින් ලබා ගැනීම;

(ආ) ඇප ඇතිව හෝ ඇප නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීමට සහ මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුවද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග, හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක කමිටුව විසින් මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර එය විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් විය යුතු ය.

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාරගැනීම, වට්ටම් ලබාදීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිල දී ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම;

(ඈ) රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන සමග නැතහොත් ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත වෙනත් යම් තැනැත්තකු හෝ ආයතනයක් සමග කොන්ත්‍රාත් හවුල් ව්‍යාපාර හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ඉ) විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට සංස්ථාවේ අරමුණු සඳහා වහාම අවශ්‍ය නොවන සංස්ථාවේ කිසියම් අරමුදල් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන ආකාරයට ඔවුන්හට වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(උ) සංස්ථාවේ කාර්ය සඳහා යම් තැනැත්තන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පුහුණු කිරීම; සහ

(ඌ) සංස්ථාවේ අරමුණු නිසි පරිදි හා ඵලදායි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපයෝගී වන සියලු දේ කිරීම;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) 6 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලසා ඇති ආකාරයට තෝරා පත් කර ගනු ලබන නිලධරයන් සංඛ්‍යාවකින් සමන්විත විධායක කමිටුවක් විසින්, මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.

(2) විධායක කමිටුවේ එක් නිලධාරියකු සමාජසේවා විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ සහකාර ලේකම් නිලයට වඩා අඩු නොවන නිලයකට අයත් නිලධරයකු විය යුතු අතර ඔහු එම අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ පදනමේ විධායක කමිටුව විය යුතු ය.

(4) පදනමේ, අනුශාසකවරුන් ද ඇතුළුව විධායක කමිටුවේ කිසිම නිලධරයකු නොකඩවා වර්ෂ තුනකට වඩා වැඩි කාලයක් එම ධුරය නොදැරිය යුතු ය.

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානයන්ට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු සාමාජික ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) විධායක කමිටුවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඇ) විධායක කමිටුවේ ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම හෝ ඔවුන් ධුරය අත්හැර යාම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ ඔවුන්ට අදාළ නියම හා කොන්දේසි;

(ඉ) විධායක කමිටුවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණ පූරණය, පුරප්පාඩු පිරවීම හා එම රැස්වීම්වල දැන්වීම්, න්‍යාය පත්‍රය හා රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම, කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සංස්ථාවේ දේපල පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් කිසි රීතියක් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනි ම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7**. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ එය වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රධාන වශයෙන් ලැබෙන මුදල් විධායක කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නමින් එක බැංකුවක හෝ බැංකු කීපයක තැන්පත් කළ යුතු ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය

**8**. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, විධායක කමිටුව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා ඒ ආයතනය විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයන් දරන්නා වූ ද, සාමාජිකයන්ගෙන් යුත් එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

**9**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති පදනමේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලුම ණය සහ පදනමට ගෙවනු ලැබිය යුතු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**10**. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල දේපලක් අත් කර ගැනීමට හා දැරීමට නීතියෙහිලා සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එම දේපල සංස්ථාවේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය. තව ද, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාවට ඇත්තේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11**. සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

සංස්ථාව ලාභ නොලබන ආයතනයක් විය යුතු බව.

**12**. සංස්ථාව ලාභ නොලබන සංවිධානයක් විය යුතු අතර, සංස්ථාවේ ප්‍රතිලාභ, ලාභ හෝ ලාභාංශ ඇත්නම් ඒවායේ කිසිම කොටසක් සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

13. (අ) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසුව කවර හෝ මුදලක් හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ මුදල හෝ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර නොබෙදිය යුතු අතර, ඒවා සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ මුදල හෝ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ කාර්ය සඳහා සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

14. සංස්ථාවේ විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයේ තම නම් ලියා අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

15. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.